**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය -2017 /2018**

**HIS 3266 - පූර්ව නූතන යුගයේ ශ්‍රී ලංකාව**

**කාලය පැ (02) දෙකයි.**

**ප්‍රශ්න (3) තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

---

1. 'පොළොන්නරුව රාජධානිය බිඳවැටීම පැරණි ලංකාවේ ඓතිහාසික වර්ධනයේ තීරණාත්මක ඛණ්ඩනයක් සළකුණු කළේ ය.' මේ අදහස විමසන්න.

2. ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

   අ). දහතුන් වන ශතවර්ෂයෙන් පසු ලංකාව තුළ ඇති වූ නව ජනගහන සැකැස්මේ මූලික ලක්ෂණ කවරේ ද?

   ආ). එම නව ජනගහන සැකැස්ම ඇතිවීම කෙරෙහි බලපෑ ඓතිහාසික සාධක මොනවාද?

3. ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

   අ). දහතුන් වන ශතවර්ෂයේ සිට දහසය වන ශතවර්ෂය දක්වා දිවයිනේ කේන්ද්‍ර අභිසාරී (centripetal) හා කේන්ද්‍ර අපසාරී (centrifugal) බලවේග කවරේද?

   ආ). එකී බලවේග මේ වකවානුවේ දේශපාලන සැකසුම්වලට කුමන හැඩයක් ලබා දුන්නේ ද?

4. ලංකාවේ බස්නාහිර, දකුණු හා උඩරට ප්‍රදේශ ආශ්‍රිතව බිහි වූ කුල සැකැස්මේ ව්‍යුහාත්මක ලක්ෂණ පෙන්වා දී, එම සැකැස්ම කෙරෙහි බල පෑ ඓතිහාසික බලවේග විමසන්න.

5. කෝට්ටේ රාජධානියේ උන්නතිය හා අවනතිය පැහැදිලි කරන්න.

6. දහතුන්වන ශතවර්ෂයෙන් පසු ලංකාවේ ඉතිහාසය තේරුම් ගැනීමෙහි ලා යාපනය රාජධානියේ ඉතිහාසය කොයිතරම් දුරට වැදගත් වන්නේ ද?